## සුදුසුකම් ඇති වයස අවුරුදු තුනේ අය හට නොමිලේ වැඩසටහන්

ඔබගේ වයස අවුරුදු තුනේ දරුවා ඇබොරිජිනල් සහ හෝ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසියෙකුනම් හෝ ළමා රැකවරණ හෝ Child FIRST මගින් උපකාර ලබා දෙයිනම්, ඔවුන් හට පැය 15 දක්වා නොමිලේ හෝ අඩු ගාස්තු පහළ බාලාංශ වැඩසටහන් ලබා ගැනීමට සුදුසුකම් තිබිය හැකිය. වැඩිදුර විස්තර සඳහා **www.education.vic.gov.au/childhood/parents/kindergarten/Pages/earlystart.aspx** වෙබ්අඩවිය වෙත පිවිසෙන්න.

## කලින් පහළ බාලාංශ ආරම්භ කිරීම සඳහාවූ අමතර ප්‍රදානය (Early Start Kindergarten extension grant)

ඔබගේ දරුවා කලින් වසරේදී කලින් ආරම්භකල පහළ බාලාංශ (Early Start Kindergarten) හෝ කලින් ඉගෙනීමට ප්‍රවේශය (Access to Early Learning) ලබා ගත්තේ නම්, ඔබට කලින් පහළ බාලාංශ ආරම්භ කිරීම සඳහාවූ අමතර ප්‍රදානය සඳහා සුදුසුකම් තිබිය හැකිය. මෙම අමතර ප්‍රදානය අදාල වන්නේ පහළ බාලාංශ ගාස්තු සහනාධාරය අදාල නොවන අවස්ථාවල වන අතර ඔබගේ දරුවාට අරමුදල් සපයන පහළ බාලාංශ වැඩසටහනකට ගාස්තු අයකිරීමකින් තොරව හෝ අවම වියදමකට සහභාගිවීමට ඉඩකඩ ලබාදීම සඳහාය.



## ද්වි භාෂා සහ භාෂාණ පරිවර්තන සේවා

ඔබගේ දරුවාගේ පහළ බාලාංශ සේවාව මගින් ඔබගේ සහ ඔබගේ දරුවාගේ අවශ්‍යතා සම්බන්ධයෙන් ඔබ සමඟ කථා කිරීමට සහාය ලබා ගැනීම සඳහා නොමිලේ ලබාදෙන දුරකථන අංක **9280 1955** ඇමතිය හැකිය.

සරණාගත පවුල් හට පහළ බාලාංශ වැඩසටහනක් සොයා ගැනීම සඳහා පදිංචිකරවීමේ නිලධාරීන් විසින්ද උපකාර ලබාදිය හැකිය.

## වැඩිදුර විස්තර

පහළ බාලාංශ වැඩසටහන් හෝ පහළ බාලාංශ ගාස්තු සහනාධාරය සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා Department of Education and Training හි වෙබ්අඩවිය වන **www.education.vic.gov.au/childhood/parents/kindergarten/Pages/fees.aspx** වෙත පිවිසෙන්න, නැතිනම් ආසන්නයේම ඇති ප්‍රාදේශීය කාර්යාලය හා සම්බන්ධ වන්න.

## ප්‍රාදේශීය කාර්යාල සමඟ සම්බන්ධවීමේ තොරතුරු

| ප්‍රාදේශීය කාර්යාලය | පිහිටීම | යතුරුපුවරුව |
|---|---|---|
| නෝර්ත් ඊස්ට් වික්ටෝරියා | Benalla | **03 8392 9500** |
| | Glen Waverley | **03 8392 9300** |
| නොර්ත් වෙස්ටර්න් වික්ටෝරියා | Bendigo | **03 5440 3111** |
| | Coburg | **03 9488 9488** |
| සවුත් ඊස්ටර්න් වික්ටෝරියා | Dandenong | **03 8765 5600** |
| | Moe | **03 5127 0400** |
| සවුත් වෙස්ටර්න් වික්ටෝරියා | Ballarat | **03 5337 8444** |
| | Geelong | **03 5225 1000** |
| | Footscray | **03 8397 0300** |

පිළියෙල කලේ:
Department of Education and Training
2, ට්‍රෙෂරි ප්ලේස්, ඊස්ට් මෙල්බර්න්
මෙල්බර්න් 3002
© වික්ටෝරියා ප්‍රාන්තය 2015 අගෝස්තු

# නොමිලේ හෝ අඩු ගාස්තු පහළ බාලාංශ

පහළ බාලාංශ ගාස්තු සහනාධාරය

Sinhalese Translation



## පහළ බාලාංශය (Kindergarten) ඔබගේ දරුවාට වැදගත් පියවරකි. පහළ බාලාංශයේදී ළමුන් ඉගෙන ගන්නා කුසලතා ඔවුන් ජීවිත කාලය පුරාම දියුණු කර ගනී.

පහළ බාලාංශ වැඩසටහන් ලබාදෙන්නේ සුදුසුකම් ලත් බාල ළමාවිය ගුරුවරුන් සහ ශික්ෂකයන් මගිනි.

පර්යේෂණ මගින් පෙන්වා දෙන ආකාරයට පහළ බාලාංශ වැඩසටහන් මගින් සෞඛ්‍යය සහ සුබසිද්ධිය, සමාජ සහ ඉගෙනීමේ ප්‍රතිඵල වැඩිදියුණුවන අතර ළමුන් පාසැලට යාමට සූදානම් කරවන බවයි.

දරුවන් පහළ බාලාංශ වැඩසටහනට සහභාගිවන වසරේ අප්‍රියෙල් 30වන දින වනවිට අවම වශයෙන් ඔවුන් වසර 4ක් සම්පූර්ණකර ඇතිනම් ඔවුනට පහළ බාලාංශ වැඩසටහනකට සහභාගිවිය හැකිය.

ඔබගේ දරුවාගේ පහළ බාලාංශ ගුරුවරයා ඔබගේ දරුවාගේ ඉගෙනීමට උපකාර කිරීම සඳහා ඔබ සමග කටයුතු කරනු ඇත.

වික්ටෝරියා ප්‍රාන්තය තුල ඇති ගුණාත්මක පහළ බාලාංශ වැඩසටහන් ලබා දෙන්නේ දිගු දිවා රැකවරණ මධ්‍යස්ථාන, ප්‍රජා පහළ බාලාංශ සහ සමහර පාසල් තුලය.

## පහළ බාලාංශ ගාස්තු සහනාධාරය

පාසල ආරම්භ කිරීමට පෙර වසරේ සියළු දරුවන්ට ඉහළ ගුණාත්මක පහළ බාලාංශ වැඩසටහන් සඳහා ප්‍රවේශය ලබාදීමට වික්ටෝරියානු රජයේ ඇති ඇපකැපවීමේ කොටසක් වශයෙන් ඔබගේ දරුවා හට පහළ බාලාංශ නොමිළේ හෝ අඩු වියදමින් ලබාගත හැකිවේ.

පහළ බාලාංශ ගාස්තු සහනාධාරය මගින් සුදුසුකම් ඇති වයස අවුරුදු හතරේ දරුවන් හට සතියකට පැය 15 දක්වාවූ පහළ බාලාංශ වැඩසටහනකට ප්‍රවේශය ලබාදේ.

## මාගේ දරුවා නොමිළේ හෝ අඩු වියදම් සහිත පහළ බාලාංශ වැඩසටහනකට සුදුසුකම් ලබයිද?

පහත අවස්ථානුගත කරුණුවලින් එකක් යටතට වැටේනම් ඔබගේ දරුවා නොමිළේ හෝ අඩු ගාස්තු යටතේ ලබාදෙන පහළ බාලාංශ වැඩසටහනකට සුදුසුකම් ලබනු ඇත.

- ඔබගේ දරුවාගේ දෙමාපියකු, රැකවරණකරුවකු හෝ නීත්‍යානුකූල භාරකරු ඇබොරිජිනල්/හෝ ටෝරස් ස්ට්‍රේට් දූපත්වාසියෙකු වශයෙන් හඳුනාගනියි නම්
- ඔබගේ දරුවාගේ උප්පැන්න සහතිකය මගින් ඔවුන් බහු උපත් දරුවෙකු (තුන් නිවුන් හෝ ඊට වැඩි) වශයෙන් හඳුනාගනියි නම්
- ඔබගේ දරුවා හෝ මාපියෙකු හෝ භාරකරුවෙකු පහත එකක් දරයි නම්:
  - කොමන්වෙල්ත් සෞඛ්‍යය රැකවරණ කාඩ්පත
  - කොමන්වෙල්ත් විශ්‍රාමික සහන කාඩ්පත
  - විශ්‍රාමලත් හමුදා සේවා කටයුතු දෙපාර්තමේන්තු ගෝල්ඩ් කාඩ්පත හෝ වයිට් කාඩ්පත
  - සරණාගත වීසා බලපත්‍රයක් හෝ එයට සුදුසුකම් ඇතිනම්






## අයදුම් කරන්නේ කෙසේද?

ඔබගේ දරුවාගේ පහළ බාලාංශ සේවයේ කාර්ය මණ්ඩලයට ඔබගේ දරුවාට ඇති සුදුසුකම සම්බන්ධයෙන් කථාකර, ඔවුනට ඔබගේ සහන කාඩ්පත, වීසා බලපත්‍රය, උප්පැන්න සහතිකය හෝ වෙනත් අදාල ලියකියවිලි පෙන්වන්න.

ඔබගේ දරුවාගේ පහළ බාලාංශය විසින් ඔබ වෙනුවෙන් ගාස්තු සහනාධාරයට අයදුම් කරනු ඇත. ඔබගේ දරුවා හට උසස් ගුණාත්මක වැඩසටහනක් නොමිළේ හෝ අඩු වියදම් යටතේ ලබා ගැනීම සඳහා ඔබගේ දරුවාගේ පහළ බාලාංශය වෙත ගෙවීම කෙළින්ම සිදු කරනු ඇත.

ඔබගේ දරුවා වෙනස් පහළ බාලාංශයකට මාරුවුවද, වසරේ ඕනෑම වේලාවක පහළ බාලාංශ ගාස්තු සහනාධාරය සඳහා අයදුම් කල හැකිය.

## මාගේ දරුවා හට පහළ බාලාංශයක් සොයා ගන්නේ කෙසේද?

එක් එක් පවුල්වල අවශ්‍යතා සපුරාලීමට, දිගු දිවා රැකවරණ මධ්‍යස්ථාන, ප්‍රජා පහළ බාලාංශ සහ සමහර පාසල් ඇතුළු විවිධ තැන්වල පහළ බාලාංශ වැඩසටහන් ලබාදෙනු ඇත.

ඔබගේ පළාතේ පහළ බාලාංශ වැඩසටහනක් සොයා ගැනීම සඳහා **www.education.vic.gov.au/findaservice/Home.aspx** වෙබ් අඩවිය වෙත පිවිසෙන්න, නැතිනම් ඔබගේ පළාතේ කවුන්සිලය හා සම්බන්ධ වන්න. ඔබගේ පළාතේ කවුන්සිලය හා සම්බන්ධවීමේ තොරතුරු **www.dtpli.vic.gov.au** වෙබ් අඩවිය වෙතට පිවිසීමෙන් ලබාගත හැකිය.